


**Children's Corner**

## නිශා කුමරි ඇවිදින්

සේද සිනිඳු සළු එළලා
මූදු යහන හැඩ කරලා
රට වඩින සඳු දැකලා
මැත දිනිඳු නිදි කිරලා

වවුල් සෙනග නිදි අතහැර
පියා හඹා යති බෝ දුර
ගෙන සඳු දෙව්ගෙන් අවසර
නිදති නෙළුම් මල් පුවතර

පවන් හමාවිත් කොඳුරන
වදන් අසා බස් මුමුණන
ගසුත් වැලුත් අත් බැඳගෙන
රඟන රැහුම් නෙත් අලවන

♦ *W. M. මධුෂිකා කල්පනි*
12 ශ්‍රේණිය C
ජනාධිපති විද්‍යාලය
මිනුවන්ගොඩ Sri Lanka

## පලතුරු වාරය ඇවිත්

ජම්බු ගහම රතුපාටයි
මිදි වැල්වල ගෙඩි බරවෙයි
දොඩම් ගහේ අතු බරවෙයි
පළතුරු වාරය පැමිණෙයි

පේර ගසෙන් ගෙඩි පිරීල
රඹුටන් ගස බිමට නැමිල
වෙරළු ගසේ මල් පිපීල
පළතුරු වාරය ඇවිල්ල

පුංචි ළමයි සැම සතුටින්
අඹ ගස් යට දුව පනිමින්
ජම්බු පේර මිදි කඩමින්
මුව පුරවා ගති සුතුටින්

♦ *සමාධි නිමේෂා සංදීපනි*
විශාකා බාලිකා විද්‍යාලය
බණ්ඩාරවෙල Sri Lanka

**ශිෂ්‍යයිනි, ළමාපිටියට ඔබේ රචනා එවන්න**

## The First Stamp in Sri Lanka
## ශ්‍රීලංකාවේ ප්‍රථම මුද්දරය




It was 143 years ago, on April 1, 1857 that the first adhesive stamp was issued in Sri Lanka (then Ceylon). The value was 6 pence. (Decimal currency Rupee and Cents was adopted only in 1872) Perkins Bacon & Co Ltd printed this first stamp. It had a purplish colour and the sheet did not have perforations and had to be cut from the sheet.

The stamp carried the left profile of the head of Queen Victoria, the ruler of the British Empire who was also Ceylon's monarch and the words **CEYLON** and **SIX PENCE.**

වසර 143 කට පෙර 1857 අප්‍රියෙල් 1 වෙනි දින ප්‍රථම අලවන මුද්දරය ලංකාවේ නිකුත් කෙරිණ. මිළ පැන්ස 6 කි. ( රුපියල් සත ලංකාවේ භාවිතයට පැමිණියේ 1872 දීය) මුද්දරයේ වර්ණය ලා දම්පැහැය වූ අතර වෙන් කරන හිල් පේලි නොවූයෙන් කතුරකින් කපාගත යුතු වීය. ලංකාව එංගලන්තයේ යටත් විජිතයක් වූ බැවින් එකල බ්‍රිතාන්‍යය් රජකළ වික්ටෝරියා රැජිණගේ හිසේ රූපයක් ද, සිලෝන් සහ සික්ස් පෙන්ස් යන ඉංග්‍රීසි අකුරුද මුද්දරයේ වීය.

♦ ***Auntie Ramani*** (**රමණි නැන්දා**)



## තොටියෙක්මි මම

දැස රිදෙන තුරු හබල් ගසමි මම
දැස රිදෙන තුරු බලා හිදිමි මම
අව්ව නිවෙන තුරු ඔරු පදවමි මම
ගෙපැලට යනතුරු නිදිනොලබමි මම

ඔරු කඳ පදවනා හබලද මට හුරුය
යනතුරු හිරු ගෙවී වෙහෙසද මා ළඟය
ගංතෙර දිගුය, දිය රැළි පෙරළිය වැඩිය
එගොඩ මෙගොඩ යනඑන තොටියා මමය

♦ ***සමාධි අසංකා කොඩිකාර***
ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය
දෙහිවල Sri Lanka

BOC

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

ලංකා බැංකුව
BANK OF CEYLON

ලන්ඩන් ශාඛාව

වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC** ගිණුමක් අරඹන්න !
උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගත කර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණීය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**

# Ananda Suraweera 's work in sculpture



explores the notion of the self portrait through the form of a mask. The work aims to address self awareness; his thoughts about mortality and death.
This work will be showing in the
**Masters Fine Arts Degree Show at**
**The City and Guilds of London Art School**
124 Kennington Park Road, London SEll 4DJ
**from 11th to 14th September.**
**www.cityandguildsartschool.ac.uk**

# පර්දාවෙන් වැසුණු බෙනසීර්ගේ මුහුණ 2007 හොඳම ප්‍රවෘත්ති ඡායාරූපයට තේරේ

## PRESS PHOTOGRAPHER'S EXHIBITION IN LONDON

The Press Photographer's Year exhibition, located in the **National Theatre** foyer, showcases outstanding photography taken for the UK media in 2007. Competition categories include news, features, arts and entertainment, portraits and sports - but in all categories, it is those frozen faces which have most impact.

**Daniel Berehulak**'s striking image of **Benazir Bhutto** adjusting her headscarf during prayers for those killed in a suicide attack has been awarded photograph of the year. His clever composition causes ambiguity about the owner of the hand on the left of the frame. Her expression is so peaceful, at first glance you would think the image was from her funeral.



**Prize-winner: Daniel Berehulak's ghostly photograph of a praying Benazir Bhutto foreshadows the tragedy of her death**

**නැ**ගෙණහිර ලන්ඩනයේ නැෂනල් තියටර් කලාගාරයේ මේ නොබෝදා පැවති බ්‍රිතාන්‍යයේ ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පීන්ගේ කැමරා නිර්මාණ ප්‍රදර්ශනයේදී ඩැනියල් බෙරුලක් නම් ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පියා විසින් ගන්නා ලද ගිය වසරේ මියගිය බෙනාසීර් බූතෝ යාඥාකරන්නට සිය හිසෙහි පර්දාව සකස් කරන අන්දම දැක්වෙන ඡායාරූපයට ගිය 2007 වසරේ හොඳම ප්‍රවෘත්ති ඡායා රූපය වශයෙන් ප්‍රථම ත්‍යාගය හිමිවිය. සුදු කළු වර්ණයෙන් ගත් එම ඡායාරූපයේ පිළිබිඹු වන බෙනාසීර් ගේ මුහුණේ ආවරණය වූ බව හා සුදු පර්දාවද නිසා කිසියම් පාළු දුක්මුසු පෙනුමක් සටහන්ව ඇත. එය නුදුරු දිනක සිදුවීමට නියමිත ඇයගේ ඛේදජනක ඉරණම කලින් කියා පෑමක් ද යන්න එම සේයාරුව බලන කෙනෙකුගේ සිතට නැගෙන්නට පුළුවන.

මෙම ඡායාරූපය ගත් කැමරාකරුවන ඕස්ට්‍රේලියානු ජාතික ඩැනියෙල් බෙරුලක් පුවත්පත් ඡායාරූප කරණයේ අද ඉදිරියෙන් සිටින ආයතනයක් වන **Getty Images** වෙනුවෙන් ලන්ඩනයේ සේවය කරයි.

# මා කැමති ඔබ කැමති ✳ ගීයක්

## තුරුළේ හංගාගෙන මා ඔබ තෙමුණා අම්මේ

දවසක් පැල නැති හේනේ
අකාල මහ වැහි වැස්සා
තුරුළේ හංගාගෙන මා
ඔබ තෙමුණා අම්මේ
පායන තුරු හිටි පියවර
සිටියා ඔබ අම්මේ

නුවර විදි යටකරගෙන
නින්දා වැහි වැගුරුණු දා
බිරිඳකගේ සෙනෙහෙ ගියා
යෝධ ඇලේ නැම්මේ
ඔබෙ සෙනෙහස සුවඳ දිදී
දැනුණා මට අම්මේ

කොළඹ අහස කලුකරගෙන
මුහුදු හුළඟ හඬලන කොට
ඔටුන්න බිම දා දුවගෙන
එන්නද එක පිම්මේ
මං එනතුරු ඉඳිකඩ ළඟ
ඉන්නවාද අම්මේ ?



**මේ** ජනප්‍රිය ගීතය ගායනා කරන්නෙ විශාරද ගුණදාස කපුගේ. මෙහි පද රචනා කළේ නීතිඥ රත්බණ්ඩා සෙනෙවි රත්නයි. අද ඒ කලාකරුවන් දෙදෙනාම ජීවතුන් අතර නැහැ. ඒත් මේ ගීය ඔබ අප අතර බොහෝ කාලයක් දැවටෙමින් පවතින බවට සැකයක් නැහැ.

අම්මා ගැන කියවෙන සිංහළ ගීත අතුරෙන් මා වඩාත් ම කැමති ගීය මෙයයි. දරුවෙකුට අම්මා නැති කලක ඒ අම්මා නිතර සිහිපත් වෙන්නෙ ආපදාවක් දුකක් ඇතිවුනාම. උපන් රටෙන් බැහැරව ඇවිත් ඉන්න අයට ඒක වඩාත් දැනෙනවා. තමන්ගෙ සැපත, තමන්ගෙ බඩ ගින්න, ශරීරසෞඛ්‍යය නොතකා දරුවා ආරක්ෂා කරන්නමයි අම්මගෙ වෑයම. දරුවන් වෙනුවෙන් ඕනම දුකක් කරදරයක් උහුලගෙන ඉඳීවි අම්මා.

මට මතක නැහැ කවුද කියලා ගිය මාසෙ හිතවතෙක් මේ පින්තූරය විද්‍යුත් තපැලෙන් එවල තිබුණ. මට එක්වරම මතක් වුනේ කපුගේ ගෙ **දවසක් පැල නැති හේනේ** ගීය. ඒ එක්කම තව දෙයක් මතකයට ආවා. මං හුඟක් පොඩි කාලෙ මේ වගේම අපි ගමනක් ගිහිං ගෙදර එනකොට ධාරාණී පාතෙට වහිද්දි කුඩබාගෙ මට දීලා අපේ අම්ම තෙමි තෙමීමයි ගෙදර ආවෙ.

" මං තෙමුණාට කමක් නෑ... පුතා තෙමෙන්න එපා..." අම්මා කිව්වා.

මේ පිංතූරෙ මම රාමුකරලා ගෙදර ගහගත්තා. පින්තූරෙ ළමයා ඔබය කියලා හිතන්න. ඉතින් මේ ඉන්නෙ ඔබේත් මගේත් අපි කාගෙත් අම්මා.

♦ ***දයා***